**සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
-----------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
---------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 24 වැනි දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 ජුලි 10 වැනි දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 ජූනි 23 වැනි දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 **මතය**
---------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට සියඹලාණ්ඩුව ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
-------------------------------------

**1.3.1** **ගිණුම්කරණ අඩුපාඩු**
---------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සමාලෝචිත වර්ෂය අවසානයට රු. 122,086,663 ක් ලෙස ගිණුම්වල දක්වා තිබුණද පිළිගත් හා අදාල වෘත්තිය සුදුසුකම් ඇති, තක්සේරු වෘත්තියේ සාමාජිකයකු විසින් තක්සේරු කර නොතිබුණි.

(ආ) සියඹලාණ්ඩුව බස් නැවතුම්පල ඉදිකරනු ලබන ඉඩම රු. 12,000,000 වටිනාකමට තක්සේරු කර තිබුණද සභාව විසින් මෙම ඉඩම නීත්‍යානුකූලව පවරා ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව සතු කොම්පෝස්ට් ව්‍යාපෘති ඉඩම සහ ඇතිමලේ පුස්තකාලය පිහිටි ඉඩම් වල වටිනාකම පිළිගත් හා අදාල වෘත්තිය සුදුසුකම් ඇති තක්සේරු වෘත්තියේ සාමාජිකයකු විසින් තක්සේරු කර ගිණුම්ගත කිරිමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු විවිධ වියදම් රු. 816,407 ක් වෙනුවෙන් ණයහිමියන් යටතේ ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්**

---------------------------

ගිණුම් විෂයයන් 09 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 25,305,720 ක් වූ අතර උප ලේඛන හා ලේඛන අනුව ශේෂය රු. 25,355,497 ක් විය.

**1.3.3 ලැබිය යුතු ගිණුම්**

--------------------

2014 ඔක්තෝබර් 24 දින ස්ථිර සේවයට පත්කරන ලද නිලධාරීන් 17 දෙනෙකු වෙනුවෙන් 2014 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා සභා අරමුදලෙන් ගෙවන ලද වැටුප් හා දීමනා වෙනුවෙන් ලැබිය යුතු රු. 934,643 ක් ප්‍රතිපූර්ණය කර ගැනිමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 224,351,114 ක වත්කම් විෂයයක් හා එකතුව රු. 11,920,339 ක වගකීම් විෂයයක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණ කිරීමට නොහැකි විය.

**2. මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 7,250,253 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,321,886 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ වැඩිවීම රු. 4,928,367 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

---------------------

**2.2.1 වෙනත් ආදායම්**

-------------------

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 149 වගන්තියේ විධිවිධාන ප්‍රකාර 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයන් සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ ලියාපදිංචි කර ඇති හෝ එම මණ්ඩලය අනුමත කර ඇති හෝටල්/ ලැගුම්හල් වලින් අදාළ

වර්ෂයට පෙර වර්ෂයේ ලැබීම් වලින් සියයට එක නොඉක්මවන ගාස්තුවක් අතුරු ව්‍යවස්ථා පනවා පළාත් පාලන ආයතන විසින් අයකර ගත යුතු වුවද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තිබෙන හෝටල්/ලැඟුම්හල් එකකින් එසේ ගාස්තු අය කිරීමට වර්ෂ ගණනාවක සිට කටයුතු කර නොතිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ විධිවිධාන අනුව සභා බල ප්‍රදේශයේ දුරකථන සමාගම් විසින් 2012 වර්ෂයේ ස්ථාපිත කර තිබූ සම්ප්‍රේෂණ කුළුණු 4 කින් වාර්ෂික බද්දක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව සතු අංක WPZA – 3137 දරන ජේ.සී.බී. යන්ත්‍රය කුලියට දීමේදී සභාව විසින් යන්ත්‍රය වෙන් කිරිම සහ මුදල් අයකර ගැනිම සඳහා ක්‍රම වේදයක් සකස් කර නොතිබීම නිසා 2014 සහ සමාලෝචිත වර්ෂය තුලදි පුද්ගලයින් 9 දෙනෙකුට යන්ත්‍රය කුලියට දීමෙන් රු. 296,775 ක් අයවිය යුතුව තිබුණි.

**2.2.2** උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.3,810,805 ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.2,358,389 ක් අයවිය යුතුව තිබුණි.

**2.2.3** කඩ බදු

---------

පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛ විධිවිධාන පරිදි සභාව සතු කඩ කාමර කුලි තක්සේරු කිරිමට කටයුතු කර නොතිබුණි.

**2.3** අධිභාර

--------

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 172 (3)වගන්තියේ විධි විධාන යටතේ වගකිව යුතු අයවළුන්ට එරෙහිව මා විසින් පනවන ලද අධිභාර අනුව 2015 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණු අධිභාර අගය රු.759,593 ක් විය.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---------------------------

විදුලිබල අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති ලිපියේ 2.1 වගන්තිය ප්‍රකාරව වීථි ලාම්පු ක්‍රියාත්මක කිරිම හා නඩත්තු කිරීම සඳහා ගාස්තු ගෙවීමේ පදනම මත පළාත් පාලන ආයතන, වීථි පහන්

ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම සඳහා සේවා සැපයුම්කරුවෙකු ලෙස කටයුතු කළ යුතු වුවත්, එසේ සිදු නොකර සමාලෝචිත වර්ෂයේදී මේ සඳහා සභා අරමුදලින් රු. 335,270 ක වියදම් දරා තිබු අතර වීථි ලාම්පු ස්ථාපනය කිරීමේදී ස්ථාපන ක්‍රමය සවි කළ යුතු ලාම්පු වර්ගය, සංඛ්‍යාව යනාදිය පිළිබඳව මෙම ලිපිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.2 කොන්ත්‍රාත් පාලනය

---------------------

(අ) සියඹලාණ්ඩුව බස් නැවතුම්පල ඉදිකිරිමේ කර්මාන්තය සඳහා සභාව සතු සතිපොල හා පුස්තකාල ජල සැපයුමෙන් ජලය ලබාගෙන තිබු අතර සමාලෝචිත වර්ෂයේ මාර්තු සහ මැයි මාසවලට අදාල රු. 53,918 ක ජල ගාස්තු කොන්ත්‍රාත්කරු විසින් ගෙවීමට කටයුතු කර නොතිබුණි. ජලය ලබා දීමේදි ජල ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් අදාල කොන්ත්‍රාත්කරු සමඟ ලිඛිත එකඟතාවයකටද එළඹ නොතිබුණි.

(ආ) ගමනැගුම අන්තර් ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මුතුකණ්ඩිය පානීය ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2014 වර්ෂයේදි ජල පොම්පාගාරය ඉදිකිරිමට රු. 691,645 ක්ද පී.වී.සි ජලනල හා අනෙකුත් ද්‍රව්‍ය මිලදී ගැනිමට රු. 5,911,599 ක් ද වශයෙන් රු. 6,603,244 ක මුදලක් වියදම් කර තිබු නමුත් විගණන දිනය වු 2016 පෙබරවාරි 29 දින වන විටත් ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබු අතර මිලදි ගෙන තිබු පි.වි.සි. නල හා අනෙකුත් උපකරණ සභා භූමියේ ගබඩා කර තිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

--------------------------------

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 71 හා 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පටහැනිව සභාවේ අනියම් හා ආදේශක පදනම මත සේවය කළ වැඩ පරිපාලක, රියදුරු, යන්ත්‍ර ක්‍රියාකරු,මාර්ග කම්කරු, මුරකරු සහ පුස්තකාල සහායක යන තනතුරු සඳහා සේවකයින් 12 දෙනෙක් අනුමත කාර්යය මණ්ඩලයට පිටින් ස්ථිර සේවයට පත් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදි තනතුරු 5 කට අදාලව අනුමත සේවක සංඛ්‍යාවට වඩා සේවකයින් 21 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

-----------------------------

**නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

------------------------------------------

සභාව සතු දොඹගහවෙල උප කාර්යාලයේ 2014 වර්ෂයේදි රු. 1,753,562 ක වියදමක් දරා ඉදි කරන ලද කුට්ටිගල් නිෂ්පාදන ඒකකය 2015 පෙබරවාරි මස වසා දමා තිබුණි.

## 3.5 ආර්ථික නොවූ ගනුදෙනු

------------------------------

(අ) සභාව සතු වාහන සහ යන්ත්‍රෝපකරණ නඩත්තු හා සේවා කටයුතු සඳහා සමාලෝචිත වර්ෂයේදි රු. 1,160,578 ක වියදමක් දරා සේවා නඩත්තු ඒකකයක් ඉදිකර තිබූ අතර එය ප්‍රයෝජනයට ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ආ) දොඹගහවෙල පිහිටි ප්‍රාදේශීය සභාවේ උප කාර්යාලයේ විද්‍යුත් පුස්තකාලයක් ආරම්භ කිරිම සඳහා අවශ්‍ය පරිගණක හා උපාංග මිලට ගැනිම සඳහා 2012 වර්ෂයේ රු. 408,200 ක් වැය කර තිබුණද විද්‍යුත් පුස්තකාල කටයුතු ආරම්භ කර නොතිබුණි. ක්‍රමවත් වැඩ පිළිවෙලකට අනුව කටයුතු සිදු නොකිරිම නිසා දරන ලද වියදමින් අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනිමට නොහැකි වී තිබුණි.

## 4. යහ පාලනය හා ගිණුම් කටයුතු භාවය

-----------------------------------------

### 4.1 අයවැය පාලනය

-------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් පිළියෙල කර තිබූ අයවැය ලේඛනය මඟින් ඇස්තමේන්තු කළ ආදායම්, වියදම් හා වර්ෂයේ තථ්‍ය ආදායම්,වියදම් අතර පෙන්නුම් කෙරෙන සැලකිය යුතු විචලනයන් අනුව ආදායම් හා වියදම් පාලනයේදී අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

### 4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

-----------------------------------

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 4.3 අභ්‍යන්තර විගණනය

--------------------------

පළාත් සභාවේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

### 4.4 විගණන හා කළමනාකරණ කමිටු

------------------------------------

2009 ජුනි 9 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක කළමනාකරණ විගණන චක්‍රලේඛ DMA/ 2009 (01) දරන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය වන විටත් කටයුතු කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය